# 23 කල්‍යාණ මිත්‍ර සම්පත්තිය සහ පාප මිත්‍ර විපත්තිය (සච්චංකිර ජාතකය)

## කල්‍යාණ මිත්‍ර සම්පත්තිය.

මිත්‍රයා යනු මෛත්‍රී ගුණයෙන් යුක්ත තැනැත්තා ය. මෙලොව පරලොව ආදි වශයෙන් පුද්ගලයාගේ සෑම අංශයක ම දියුණුව බලාපොරොත්තුවෙන් කටයුතු කරන්නේ කල්‍යාණ මිත්‍රයා ය. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය යනු එබඳු මිතුරන්ගේ ඇසුර ලැබීමයි. කල්‍යාණ මිත්‍රයෝ සිව් දෙනෙකි.

1. මිතුරාට උපකාරයක් ම කරන **උපකාරක** මිත්‍රයා
2. සැප දුක් දෙකෙහි ම මිතුරාගේ ළඟ සිටින **සමාන සුඛ දුක්ඛ** මිත්‍රයා
3. මිතුරාට යහපතක් ම කියා දෙන **අත්ථක්ඛායි** මිත්‍රයා
4. මිතුරාට අනුකම්පා කරන **අනුකම්පක** මිත්‍රයා

කල්‍යාණ යනු යහපත යි. ඒ අනුව මේ සෑම මිතුරෙකු ම පුද්ගලයාගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම විශේෂ ලක්ෂණය යි.

## පාප මිත්‍ර විපත්තිය.

තමන්ටත් අනුන්ටත් අයහපත පිණිස හේතුවන, තිදොරින් සිදුවන ක්‍රියා පව් ය. ඒවා සිදුකරන්නේ පව්කාරයන් ය. එවැනි පව්කාරයන් මිතුරන් වශයෙන් අපේ ඇසුරට පැමිණීම ස්වාභාවික ය. එවැන්නන්ගේ ඇසුර නිසා හැමෝම මෙලොව වශයෙන් විවිධ කරදරවලට පත්වෙති. පීඩා විඳිති. පසු තැවෙති. ඔවුන්ගේ පාප ක්‍රියාවලට හවුල් වීමෙන් දුක් විපාක මෙලොවදී ත් පරලොවදී ත් විඳින්නට සිදු වේ. දිගින් දිගට ම ඔවුන්ගේ ඇසුර ලබන පුද්ගලයා නිවන් සුවය දුරින් ම දුරස් කර ගනී. පාප මිත්‍රයන්ගේ ඇසුර මහා විපත්තියක් ලෙස සැලකෙන්නේ ඒ නිසා ය. පාප මිත්‍රයෝ ද සිවුදෙනෙකි.

1. මිතුරාගෙන් කිසිවක් ගෙන යෑමේ අදහසින් ම ඇසුරු කරන **අඤ්ඤදත්ථුහර** මිත්‍රයා.
2. වචනයෙන් පමණක් සංග්‍රහ කරන **වචීපරම** මිත්‍රයා.
3. මිතුරාගේ වචනය කුමක් වුවත් අනුමත කරන **අනුප්පියභාණි** මිත්‍රයා.
4. පරිහානිය සඳහා ම හේතුවන **අපාය සහායක** මිත්‍රයා.

පුද්ගලයා පාපයට ම නැඹුරු කිරීම මේ පාප මිත්‍ර හෙවත් මිත්‍ර ප්‍රතිරූපකයින්ගේ ලක්ෂණය යි.

කලණ මිතුරු ඇසුර සම්පත්තියක් ලෙස සලකා ලංකර ගැනීමටත් පාප මිතුරු ඇසුර විපත්තියක් ලෙස සලකා දුරස් කිරීමටත් අප වගබලා ගත යුතු ය. මේ සඳහා අප අතරට පැමිණෙන සියලු මිතුරන් ගැන පරීක්ෂාකාරීව සොයා බැලීම වැදගත් ය.

කලණ මිතුරු ඇසුර සම්පත්තියක් වන ආකාරයත් පාප මිතුරු ඇසුර විපත්තියක් වන ආකාරයත් ජාතක පොතේ සඳහන් සච්චංකිර ජාතකයෙන් අවබෝධ කරගත හැකි ය.

### සච්චංකිර ජාතකය

බුදුරජාණන් වහන්සේ මේ ජාතක කතාව දේශනා කර ඇත්තේ දේවදත්ත තෙරුන් තමන් වහන්සේට සිදුකළ විවිධ උපද්‍රව නිමිති කරගෙන ය.

පෙර බරණැස් නුවර විසූ බ්‍රහ්මදත්ත නම් රජතුමාට පුතෙක් විය. ඔහු ඉතා නපුරු ය. සැර පරුෂය. කිසිවෙකුටත් නොගසා නොබැණ හෝ කථා කිරීමේ පුරුද්දක් ඔහුට නොවීය. රජගෙදර අයට පමණක් නොව සෙසු මහජනයාට ද මේ කුමාරයා මහත් හිසරදයක් විය. ඒ නිසා ම ඔහු ''දුෂ්ට කුමාර'' යැයි ප්‍රසිද්ධ විය.



දිනක්..... හෙතෙම පිරිවර සමග දියකෙළියට ගඟට ගියේ ය. ඒ මොහොතේ මහ වැස්සක ලකුණු පහළ විය. තම අතවැස්සන් ඇමතූ කුමාරයා 'ඉක්මණින් මා ගඟ මැදට ගෙන ගොස් නාවාගෙන වරෙව්' යයි අණ කළේ ය. ඔහුගෙන් මිදීමට අවස්ථාවක් බලා සිටි සේවකයෝ ගඟ මැදට ගෙන ගොස් ඔහු දියේ ගිල්වා දමා ආපසු නගරයට ගියහ. කුමාරයා කොහිදැයි රජතුමා විමසූ විට 'දේවයන් වහන්ස අපි නොදනිමු. වැස්ස නිසා පිහිනා අපට කලින් එන්නට ඇතැයි සිතා ආවෙමු' යි කීහ. රජතුමා මිනිසුන් යවා පරීක්ෂා කරවී ය. කිසිවෙකුටත් කුමරුන් සොයා ගත නොහැකි විය.

දියේ ගිලුනත් කුමරු මියගියේ නැත. ගඟ දිගේ ගහගෙන යන කුමාරයා පාවෙමින් එන ලී කොටයක් දැක එහි එල්ලී ඒ මත නැගුණේ ය. දැන් හෙතෙම මරණ බියෙන් තැති ගෙන හඬ හඬා යයි. මේ අතර ඒ නුවර විසූ සිටු පුත්‍රයෙක් හතළිස් කෝටියක් ධනය ගං ඉවුරේ නිධන් කොට ඒ ගැන ලෝභයෙන් මිය ගොස් එහිම සර්පයෙකු ව ඉපිද සිටියේ ය. තවත් සිටු පුත්‍රයෙක් තිස් කෝටියක් ධනය නිධන් කොට මිය ගොස් ඒ ගං ඉවුරේ ම මීයෙකු ව ඉපිද සිටියේ ය. එද එම මහ වැස්සෙන් මේ දෙදෙනා හුන් තැනට ද ගංවතුර අවුත් දෙදෙනා ගසා ගෙන ගියෝ ය. ඉහත කී කොටය අසු වී ඔව්හු ද ඒ මතට ම නැග ගත්හ. මේ අතර ඒ ගඟ අසළ දිඹුල් ගසක ගිරවෙක් ද විය. ඒ ගස ද මුල සේදී ගඟට ඇද වැටිණ. එවිට දියෙන් තෙත බරිත වූ ගිරවා ද පියාඹාගත නොහැකි ව එම කොටය මතට ම නැග ගත්තේ ය. දැන් මේ සියලු දෙනා ගඟේ පාවී යති.

මේ කාලයේ බෝසතාණන් වහන්සේ ද කසී රට බමුණු කුලයක ඉපිද සිටියෝ ය. ගිහිගෙය කලකිරී තවුස් පැවිද්දෙන් පැවිදි වූ එතුමා ඒ ගං ඉවුර අසළ අසපුවක් තනා ගෙන වාසය කර සිටි සේක. එද මහ රෑ භාවනාවේ යෙදී සිටි උන්වහන්සේට මේ කුමාරයාගේ හැඬීම ඇසිණ. කරුණාවෙන් බර ව ගං ඉවුරට ගිය උන්වහන්සේ එම කුමාරයා දැක කොටයෙන් අල්ලා ගොඩට ගත්හ. කොටය මත තවත් සතුන් ඇති බව උන්වහන්සේ දුටුවේ ගොඩට ගත් පසුව ය.

ඒ සියල්ලන් අසපුවට ගෙන ගොස් ගිනි ගොඩක් ගසා ඒ අසළ හිඳුවා උණුසුම් කරවී ය. මිනිසුන්ට වඩා තිරිසන් සතුන් දුර්වල බැවින් පළමු කොට සතුන්ට ගිනි තැපීමට සලස්වා අන්තිමට කුමාරයාට ගිනි තැපීමට දුන්නේ ය. මෙයින් කිපුණු කුමරා මා රාජ කුමාරයෙක් බවවත් නොසළකා පළමු කොට සතුන්ට සැලකුවේ යැයි කියා තවුසාණන් කෙරෙහි වෛර බැඳ ගත්තේ ය.

බෝසතාණන් වහන්සේගේ සත්කාර විඳිමින් කිහිප දිනක් එහි ම රැඳුණු ඒ සිවුදෙනා හොඳින් සුවපත් වූ පසු යන්නට අවසර ඉල්ලූහ. අවසර ලැබිණි. මීයාත් සර්පයාත් තම තමන් සතු ධනයේ ප්‍රමාණය කියා තමන් වසන තැන සළකුණු දන්වා 'ඔබතුමන්ට ධනය වුවමනා වූ විටෙක අප සිටින තැනට පැමිණ නම කියා ඇමතුව මැනව' යි සමු ගෙන ගියහ. ගිරවා ද 'ඔබතුමන්ට ඇල් සහල් වුවමනා වූ විටක මා සිටින තැනට පැමිණ කතා කරනු මැනවි. එවිට මම මගේ නෑයන් සමග ඔබතුමන්ට අවශ්‍ය තරම් ඇල් වී ගෙනවුත් දෙමි' යි කියා සමු ගත්තේ ය. රාජ කුමාරයා වෛරය සිත තබා ගෙන ම' ස්වාමිනි මා රජ වූ කල්හි පැමිණෙනු මැනව. සංග්‍රහ කරමි'යි  සමු ගෙන ගියේ ය.

නොබෝ කලෙකින් තාපසතුමා මේ පිරිස ගැන විමසනු පිණිස පිටත් ව, පළමු ව ගියේ සතුන් තිදෙනා වෙත ය. නම කී සැණින් ඔවුහු පැමිණ වැඳ, 'අප සතු මේ සම්පත්වලින් උවමනා තරමක් රැගෙන යනු මැනවැ' යි දන්වා සිටියහ. තවුසාණෝ ද ඔවුන්ගේ කෘතඥතාව ගැන සතුටු ව 'උවමනා වුවහොත් ගනිමි' යි කියා කිසිවක් නො ගෙන රජකුමරු හමු වීමට නගරය බලා ගියහ.

මේ වන විට බරණැස් රජතුමා මිය පරලොව ගොස් ඉහත කී දුෂ්ට කුමාරයා රජකමට පත් ව සිටියේ ය. තාපසයාණන් වහන්සේ මඟුල් උයනෙහි දිනක් ගත කොට දෙවන දින පිඬු සිඟා ගැනීම පිණිස නගරයට වැඩියහ. ඒ මොහොතේ ඇතු පිටින් නුවර වීථි සංචාරයේ යෙදී සිටි රජකුමරු දුර දී ම

තවුසා දක හැඳින ගත්තේ ය. තමාට කළ මදි පුංචිකම සිහි කළ හෙතෙම රාජපුරුෂයන් අමතා, 'මේ හොර තවුසා කිසිවක් ඉල්ලන්නට එන්නේ ය. ඔහු පිටිතල හයා බැඳ නුවර හන්දියක් පාසා ගෙන ගොස් තලා හිස ගසා දමව්' යැයි නියෝග කළේ ය.

නියමය පිළිගත් සේවකයන් විසින් එසේ තලා පෙළා ගෙන යද්දී නවතින හැම තැනක දී ම තවුස් තුමා මෙසේ කියයි.

'දියෙහි පා වෙන ලී කොටයක් ගොඩ දැමීම තරම්වත් ඇතැම් අසත්පුරුෂයන්ට කරන උපකාරය නො වටී. මක් නිසා ද යත් දියෙන් ගොඩ ගත් ලී කොටය දරට හෝ ප්‍රයෝජන වන්නේ ය. එහෙත් අසත්පුරුෂයාට කරන උපකාරය එසේ නො වේ. එබඳු කෙනෙක් දියෙන් ගොඩ ගෙන ය, මා මේ දුක් විඳින්නේ'' යනුවෙනි.

මේ කතාව නිතර නිතර කියන විට එසේ කීමේ හේතුව කුමක්දැයි රාජපුරුෂයෝ විමසූහ. එවිට තවුස් තුමා සියලු පුවත් විස්තර කළේ ය. ඒ ඇසූ මිනිස්සු තමාට මෙතරම් උපකාර කළ කෙනෙකුටත් මෙසේ කරන මේ දුෂ්ට රජුගෙන් අපට කිනම් ඵලයක් දැයි කිපී, රජ කුමරු ඇතු පිටින් බිමට ඇද මරා දමා බෝසතුන් නංවා ගෙන ගොස් රජ තනතුරට පත් කර ගත්හ.

බෝසතාණන් වහන්සේ ද දැහැමින් රජ කරන අතර, ඉහත කී සතුන් එකිනෙකා වෙත සහ පිරිවරින් ගියේ ය. පළමුව සර්පයා වෙත ගොස් ඔහු දුන් සතළිස් කෝටියත්, මීයා වෙත ගොස් ඔහු දුන් තිස් කෝටියත් රැගෙන ඔවුන් දෙදෙනා ද කැටුව ගිරවා වෙත ගියේ ය. ගිරවා වහා පැමිණ කොතරම් ඇල් වී වුවමනා දැයි ඇසී ය. වුවමනා වුවහොත් කියමි යි කියා ගිරවා ද කැටුව ගොස් ඔවුන් තිදෙනට විසීමට සුදුසු පරිදි ගෙවල් තනවා දී සියලු සංග්‍රහ ද කළේ ය.

මෙසේ සියලු දෙනා ම සතුටින් සමගියෙන් වාසය කොට මිය පරලොව ගියහ. එද දුෂ්ට කුමාර ව උපන්නේ දෙව්දත් තෙරුන් ය. සර්පයා සැරියුත් තෙරුන් ය. මීයා මුගලන් තෙරුන් ය. ගිරවා ආනන්ද තෙරුන් ය. දැහැමි තාපසයා වූයේ බුදුරජාණන් වහන්සේ ය.

**ක්‍රියාකාරකම 23.1**

පහත සදහන් වාක්‍ය සඳහා ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මිතුරාට යහපතක් ම කියා දෙන මිතුරා
    1. උපකාරක ය
    2. අත්ථක්ඛායි ය
    3. සමාන සුඛ දුක්ඛ ය
2. මිතුරාට උපකාරයක් ම කරන මිතුරා
    1. අනුකම්පක ය
    2. උපකාරක ය
    3. අත්ථක්ඛායි ය
3. සැප දුක් දෙකෙහි ම ළඟ සිටින මිතුරා
    1. සමාන සුඛ දුක්ඛ ය
    2. අනුකම්පකය
    3. අත්ථක්ඛායි ය
4. මිතුරාට අනුකම්පා කරන මිතුරා
    1. අත්ථක්ඛායි ය
    2. සමාන සුඛ දුක්ඛ ය
    3. අනුකම්පක ය
5. මිතුරාට වචනයෙන් පමණක් සංග්‍රහ කරන මිතුරා
    1. අනුප්පියභාණී ය
    2. වචීපරම
    3. අඤ්ඤදත්ථුහර ය
6. කිසිවක් රැගෙන යාමේ අදහසින් ඇසුරු කරන මිතුරා
    1. අපාය සහායක ය
    2. අනුප්පියභාණී ය
    3. අඤ්ඤදත්ථුහර ය
7. මිතුරාගේ වචනය අනුමත කරන මිතුරා
    1. අනුප්පියභාණී ය
    2. වචීපරම ය
    3. අඤ්ඤදත්ථුහර ය

8. පරිහාණිය සදහා ම හේතුවන මිතුරා
   1. වචීපරම ය.
   2. අපාය සහායක ය.
   3. අඤ්ඤදත්ථුහර ය.

**ක්‍රියාකාරකම 23.2**

පහත සදහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේ ද?

| | ප්‍රකාශය | කවුරුන් | කා හට |
|---|---|---|---|
| 1 | ඔබතුමන්ට ඇල් සහල් වුවමනා විටක මා සිටින තැනට පැමිණ කතා කරනු මැනවි. | | |
| 2 | දියෙහි පා වෙන ලී කොටයක් ගොඩ දැමීම තරම්වත් ඇතැම් අසත්පුරුෂයන්ට කරන උපකාරය නොවටී. | | |
| 3 | දේවයන් වහන්ස, අපි නොදනිමු. වැස්ස නිසා පිහිනා අපට කලින් එන්නට ඇතැයි සිතා ආවෙමු. | | |
| 4 | මේ හොර තවුසා මගෙන් යම් කිසිවක් ඉල්ලන්නට එන්නේ ය. | | |
| 5 | ඔබතුමන්ට ධනය වුවමනා වූ විටක අප සිටින තැනට පැමිණ නම කියා ඇමතුව මැනව. | | |

## ක්‍රියාකාරකම 23.3

ගිරවා, මීයා, නයා යන සතුන් තුළ පැවති කල්‍යාණ මිත්‍ර ලක්ෂණ තුනක් හා දුෂ්ට කුමාරයා තුළ පැවති පාප මිත්‍ර ලක්ෂණ තුනක් ලියා දක්වන්න.

කල්‍යාණ මිත්‍ර ලක්ෂණ

1. ...............................................................................................
2. ...............................................................................................
3. ...............................................................................................

පාප මිත්‍ර ලක්ෂණ

1. ...............................................................................................
2. ...............................................................................................
3. ...............................................................................................

### පුහුණුවට

සච්චං කිරෙවමාහංසු - නරා එකච්චියා ඉධ
කට්ඨං විප්ලාවිතං සෙය්‍යො - නත්වෙකච්චියා නරො

-සච්චංකිර ජාතකය-

දියෙහි යන දණ්ඩට
පිහිටක් වෙතත් පෙර සිට
දුදනන් හට පිහිට
නොවචි යන බස සැබෑ කළෙ මට

-ගුත්තිල කාව්‍යය-

දියෙහි පාවෙන ලී කොටයක් ගොඩ දැමීම උතුම් වුවත්, ඇතැම් අසත්පුරුෂ මිතුරන්ට උපකාර කිරීම උතුම් නොවේ යැයි ලොව නුවණැත්තන් කියන කතාව සැබෑවකි.